# වික්ටෝරියාවේ ටිකට් ලබා ගැනීම සම්බන්ධ ඔබේ මාර්ගෝපදේශය




**2024**
වසරේ ගාස්තු

Free Tram Zone (ගාස්තු අය නොකරන ට්‍රෑම් රථ කලාපයේ) සිතියම ඇතුළත් වේ

PUBLIC TRANSPORT VICTORIA

## ඔබේ myki කාඩ්පත මිලදී ගෙන එයට අවශ්‍ය මුදල් ප්‍රමාණය දමන්න

සම්පූර්ණ ගාස්තු අයකරන කාඩ්පතක මිල ඩොලර් 6 ක් වන අතර සහන කාඩ්පත් වර්ගවල මිල ඩොලර් 3 ක් වේ.

ඔබට ඔබේ myki කාඩ්පත මිල දී ගෙන පහත ආකාරයෙන් එයට අවශ්‍ය මුදල් ප්‍රමාණය දැමිය හැකිය:

- සියලු 7-Elevens ඇතුළු සිය ගණනක් සාප්පු වලින්
- තෝරාගත් ස්ථානවල හා නවතුම්වල තිබෙන myki යන්ත්‍ර මගින්
- ප්‍රධාන දුම්රිය ස්ථානවල ඇති ටිකට් කාර්යාල වලින්
- PTV මධ්‍යස්ථාන වලින්
- ක්ෂණිකව අවශ්‍ය මුදල් ප්‍රමාණය දැමිය හැකි යන්ත්‍ර (myki Money උපරිම ඩොලර් 50 ක් වේ)
- **ptv.vic.gov.au** වෙතින් හෝ **1800 800 007** ඇමතීමෙන් (මාර්ගගතව අවශ්‍ය මුදල් ප්‍රමාණය දැමීමට විනාඩි 45ක් ගතවිය හැකිය)

ඔබේ ජංගම දුරකථනය මත PTV යෙදුම භාවිතා කිරීමෙන් ද ඔබට ක්ෂණිකව myki Money ඔස්සේ අවශ්‍ය මුදල් ප්‍රමාණය දැමිය හැකිය (NFC rඅවශ්‍ය වනු ඇත).

ඔබට මුදල් දැමිය හැකි ආසන්නයෙන්ම පිහිටි ස්ථාන **ptv.vic.gov.au/retail** වෙතින් සොයා ගන්න

සහන කාඩ්පතක් (ළමා, ජ්‍යෙෂ්ඨ හා සහන) සඳහා ඔබ සුදුසුකම් ලබන්නේ ද යන්න **ptv.vic.gov.au/concession** වෙතින් පරීක්ෂා කරන්න

## myki Pass හෝ myki Money තෝරා ගන්න

ඔබ ගමන් කරන වාර ගණන මත පදනම්ව, ඔබට myki Pass හෝ myki Money ඔස්සේ අවශ්‍ය මුදල් ප්‍රමාණය දැමිය හැකිය. ඔබේ කාඩ්පත මේ දෙකෙන් එකකට බද්ධ කර නැත, ඔබ මුදල් දමන එක් එක් අවස්ථාවේ දී ඔබට වඩාත්ම සුදුසු දේ තෝරා ගන්න.

myki Money සහ myki Pass යන දෙකම එකම අවස්ථාවේ ඔබේ කාඩ්පතේ තිබිය හැකි නමුත්, ඔබේ කාඩ්පත මුලින්ම myki Pass භාවිතා කරනු ඇත.

ඔබේ myki Money ශේෂය ඍණ අගයක තිබේ නම් ඔබේ myki Pass ක්‍රියාත්මක නොවනු ඇත.

**ptv.vic.gov.au/fares** වෙතින් ඔබේ ගාස්තු පිළිබඳ වැඩිදුර සොයා බලා myki Money හා myki Pass සංසන්දනය කරන්න

# myki Money

**ඔබ ගමන් කරන්නේ කලාතුරකින් නම්, ගමන් කරන විටදී ගෙවීම සිදු කරන්න.** ඔබේ myki වෙත මුදල් දැමූ පසු, එය ඔබ ගමන් කරන ස්ථානය අනුව අඩුම ගාස්තුව ගණනය කරනු ඇත.

ඔබ දවසේ සිදු කරන පළමු කාඩ්පත් ස්පර්ශය මගින් පැය 2ක ගාස්තුවක් නිර්මාණය වේ. ඔබ පැය 2කට පසුව තවමත් ගමන් කරමින් සිටින්නේ නම්, ඔබෙන් දෛනික ගාස්තුවක් අය කෙරේ.

| | පැය 2** | |
|---|---|---|
| | **සම්පූර්ණ ගාස්තුව** | **සහන** |
| **1+2 කලාපය** | ඩොලර් 5.30 | ඩොලර් 2.65 |
| **2 වැනි කලාපය පමණි** | ඩොලර් 3.30 | ඩොලර් 1.65 |
| | **දිනපතා** | |
| | **සම්පූර්ණ ගාස්තුව** | **සහන** |
| **1-15 කලාපය** | ඩොලර් 10.60 | ඩොලර් 5.30 |
| **2 වැනි කලාපය පමණි** | ඩොලර් 6.60 | ඩොලර් 3.30 |
| **සතිඅන්තය#** | ඩොලර් 7.20 | ඩොලර් 3.60 |

** ඔබ දවසේ සිදු කරන පළමු කාඩ්පත් ස්පර්ශය මගින් පැය 2ක ගාස්තුවක් නිර්මාණය වේ. ඔබ පැය 2කට පසුව තවමත් ගමන් කරමින් සිටින්නේ නම්, ඔබෙන් දෛනික ගාස්තුවක් අය කෙරේ. # රජයේ නිවාඩු දින ඇතුළත් වේ.

# myki Pass

**ඔබ නිතර ගමන් කරන්නේ නම්, අනුගාමී දින සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණය දමන්න.** ඔබ සතියකට දින පහකට වඩා ගමන් කරන විට, ඔබට myki Pass වෙතින් ඉතිරි කර ගැනීමට හැකිය.

කලාප 1-15 සඳහා දින හතක ගමන් කිරීම් සසඳන්න:

myki Money **ඩොලර් 67.40** (5 x දිනපතා + 2 x සති අන්ත දිනපතා)
myki Pass **ඩොලර් 53.00** (දින 7 පාස්)

| | දින 7 | |
|---|---|---|
| | **සම්පූර්ණ ගාස්තුව** | **සහන** |
| **1+2 කලාපය** | ඩොලර් 53.00 | ඩොලර් 26.50 |
| **2 වැනි කලාපය පමණි** | ඩොලර් 33.00 | ඩොලර් 16.50 |
| | **දින 28 – 325^** | |
| | **සම්පූර්ණ ගාස්තුව** | **සහන** |
| **1-15 කලාපය** | ඩොලර් 6.36◊ | ඩොලර් 3.18◊ |
| **2 වැනි කලාපය පමණි** | ඩොලර් 3.96◊ | ඩොලර් 1.98◊ |

^ ඔබ දින 325ක් සඳහා myki Pass එකක් මිලදී ගත් විට, ඔබට අමතර දින 40ක් නොමිලේ ගමන් කිරීමට ඉඩ සැලසෙයි.
◊ එක් දිනයක් සඳහා මිල.

## උපරීම දෛනික ගාස්තු

**ගාස්තුවේ අගය සීමාව**

$

- ✓ දවස පුරා අසීමිත ගමන්
- ✓ ඕනෑම දුම්රියක, ට්‍රෑම් රථයක හෝ බස් රථයක*
- ✓ මෙල්බර්න් පුරා සහ වික්ටෝරියාවේ සෑම තැනකටම##
- ✓ ඔබ 2 වැනි කලාපය තුළ පමණක් ගමන් කරන්නේ නම්, ඔබේ ගාස්තුව වඩා ලාභදායී වේ

| දෛනික උපරිමය | සතියේ දින | සති අන්තය# |
|---|---|---|
| සම්පූර්ණ ගාස්තුව | ඩොලර් 10.60 | ඩොලර් 7.20 |
| සහන | ඩොලර් 5.30 | ඩොලර් 3.60 |

* SkyBus, පුද්ගලිකව පවත්වාගෙන යන සේවාවන් සහ වික්ටෝරියා ප්‍රාන්තයෙන් පිටත ආරම්භ වන හෝ අවසන් වන ගමන් බැහැර කරයි. ## දුරගමන් V/Line සේවා සඳහා කඩදාසි ටිකට්පත් අවශ්‍ය වේ. # රජයේ නිවාඩු දින ඇතුළත් වේ.

myki කාඩ්පතක් (ඩොලර් 6 සම්පූර්ණ ගාස්තුව අය කරන, ඩොලර් 3 සහන) එක් වරක් මිලදී ගැනීම මිල ගණන් වලට ඇතුළත් නොවේ.

## ඔබේ myki කාඩ්පත භාවිතා කිරීම (ස්පර්ශය ක්‍රියාත්මක කිරීම සහ අක්‍රිය කිරීම)

ඔබ දුම්රියකට, බස් රථයකට සහ බොහෝ ට්‍රෑම් රථවලට ඇතුලුවන සෑම අවස්ථාවකදීම කාඩ්පත ස්පර්ශ කිරීම ක්‍රියාත්මක කළ යුතුය. ඔබට හොඳම ගාස්තුව ලැබෙන බව සහතික කිරීමට ස්පර්ශය අක්‍රිය කරන්න. ස්පර්ශය ක්‍රියාත්මක කිරීමට සහ අක්‍රිය කිරීමට ඉක්මන් මාර්ගෝපදේශයක් මෙන්න:

| | කාඩ්පත් ස්පර්ශය ක්‍රියාත්මක කිරීම | කාඩ්පත් ස්පර්ශය අක්‍රිය කිරීම |
|---|---|---|
| ප්‍රධාන නගරයට සම්බන්ධ දුම්රිය | ✓ | ✓ |
| ප්‍රධාන නගරයට සම්බන්ධ බස් රථ | ✓ | ✓ |
| ට්‍රෑම් රථ - Free Tram Zone වලින් පිටත | ✓ | ✗ |
| ට්‍රෑම් රථ - Free Tram Zone හෝ City Circle (නගර කවය) ඇතුළත◊◊ | ✗ | ✗ |

◊◊ ගමන් මාර්ග 35

## PTV යෙදුම

PTV යෙදුම ඔබේ myki කළමනාකරණය කර ගනීමට හා මෙල්බර්න් හෝ වික්ටෝරියාව හරහා ඔබේ ගමන් සැලසුම් කර ගැනීමට උපකාරී වන විශේෂාංග වලින් පිරී ඇත.

එය App Store හෝ Google Play store වෙතින් නොමිලේ බාගත කරන්න, නැතහොත් වැඩිදුර දැන ගැනීමට **ptv.vic.gov.au/app** වෙත පිවිසෙන්න.

## ප්‍රාදේශීය වික්ටෝරියාව තුළ myki

**V/Line දුම්රිය සඳහා ඔබට myki කාඩ්පතක් අවශ්‍ය වන්නේ:**

- ඔබ මෙල්බර්න් නගරය සහ පහත දැක්වෙන ස්ථාන අතර ගමන් කරන අවස්ථාවලදී ය:
  - ගූර්නෝන් සහ රේවුඩ් (බෙන්ඩිගෝ)
  - සේමූර්
  - ට්‍රැරල්ගොන්
  - වෝර්න් පොන්ඩ්ස් (ජීලෝන්)
  - වෙන්ඩෝරි (බැලරැට්)
- බැලරැට්, බෙන්ඩිගෝ, බාක්චුස් මාශ්, ජීලෝන්, සේමූර්, කිල්මෝර්, වොලන් සහ ලාට්රෝබ් නිම්නය තුළ බස් රථ.

myki කලාපවලින් පිටත සිදු කරන ගමන් ඇතුළත් සංචාර සඳහා කඩදාසි ටිකට්පතක් අවශ්‍ය වේ.

myki කලාප පිළිබඳ වැඩිදුර විස්තර සඳහා **ptv.vic.gov.au/fares** වෙත පිවිසෙන්න

## ප්‍රාදේශීය වික්ටෝරියව තුළ කඩදාසි ටිකට්පත් භාවිතා කිරීම

**myki සීමාවෙන් ඔබ්බට ඔබ ගමන් කරන්නේ නම්, ඔබට V/Line කඩදාසි ටිකට් පතක් අවශ්‍ය වේ:**

- බ්‍රේන්ස්ඩේල්, ඕල්බරි, ෂෙපර්ටන්, එචුකා, ස්වෝන් හිල්, අරරැට්, මේරිබොරෝ හෝ වොරනැම්බෝල් වෙත හා සිට ක්‍රියාත්මක වන දුරගමන් දුම්රිය සඳහා
- සියලුම V/Line දුර ගමන් බස් රථ සඳහා.

**ඔබ නගර අතර ධාවනය වන බොහෝ ප්‍රදේශයන්හි දේශීය බස් රථවල ගමන් කරන්නේ නම්:**

- ඔබට ප්‍රාදේශීය බස් කඩදාසි ටිකට්පතක් අවශ්‍ය වේ.

ඔබට ඔබේ ප්‍රාදේශීය බස් කඩදාසි ටිකට්පත බස් රථයෙන් මිලදී ගත හැකිය.

ඔබ V/Line දුරගමන් සේවාවන් භාවිතයෙන් සංචාරය කරන්නේ නම්, කලින් සැලසුම් කර, හැකි නම්, වෙන්කරවා ගැනීමක් කරන්න.

ඔබට මර්ගගතව වෙන්කරවා ගැනීමක් කිරීමට හැකිය, නැතහොත් **vline.com.au** වෙත පිවිසීමෙන් ඔබට ළඟම ඇති ප්‍රවේශපත්‍ර අලෙවිසැල සොයා ගත හැකිය

**ඔබට ඔබේ V/Line කඩදාසි ටිකට්පත පහත දැක්වෙන ආකාරයෙන් මිලදී ගත හැකිය:**

- **vline.com.au/book** වෙතින් හෝ **1800 800 007** ඇමතීමෙන්
- කාර්ය මණ්ඩලයක් සහිත ප්‍රධාන නාගරික දුම්රිය ස්ථානවලින්
- V/Line ටිකට් නියෝජිතයෙකුගෙන්

ඔබේ ටිකට්පත මිලදී ගැනීමේළඟම ස්ථානය සොයා ගැනීමට **vline.com.au/wheretobuy** වෙත පිවිසෙන්න

| **තනි ගමන** | හෝ | **ආපසු ගමන** |
|---|---|---|

**තනි ගමන**

ඔබගේ V/Line සංචාරයේ දිශා දෙකෙන් එක් දිශාවකට පැය දෙකක් සඳහා නොමිලේ ලැබෙන නාගරික ප්‍රදේශයන්හි සංචාර ඇතුළත් එක් මාර්ග ගමනක්.

**ආපසු ගමන**

ටිකට්පතේ මුද්‍රණය කර ඇති මූලාරම්භය සහ ගමනාන්තය අතර එකම දිනයේ හෝ වෙනස් දිනවලදී සිදු කරන ආපසු ගමන. මෙයට නොමිලේ ලැබෙන නාගරික ප්‍රදේශයන්හි සංචාර ඇතුළත් වේ.

**myki pass සඳහා දිගු ටිකට්පත්**

ඔබට myki Pass එකක් තිබේ නම් සහ දුරස්ථ දුම්රිය ස්ථානයක් වෙත/ ස්ථානයක සිට ගමන් කරන්නේ නම්, ඔබ ගමන් කිරීමට පෙර myki ක්‍රියාත්මක කළ හැකි, කාර්ය මණ්ඩලය සහිත V/Line දුම්රිය ස්ථානයකින් හෝ ප්‍රධාන නාගරික දුම්රිය ස්ථානයකින් V/Line කඩදාසි ටිකට් පතක් ලබා ගැනීමට ඔබට සිදුවනු ඇත.

ඔබගේ මුළු ගමන අතරතුර ඔබගේ ටිකට් පත ළඟ තබා ගැනීමට මතක තබා ගන්න. ඔබට ටිකට්පතක් තිබේ නම්, ඔබ ගමන් කරන විට එය ඔබේ සහන කාඩ්පත සමඟ එය පෙන්විය යුතුය.

V/Line කඩදාසි ටිකට්පත් ගාස්තු ගැන වැඩිදුර විස්තර සඳහා, **vline.com.au/tickets** වෙත පිවිසෙන්න

ප්‍රාදේශීය බස් රථවල කඩදාසි ටිකට්පත් ගාස්තු සඳහා, **ptv.vic.gov.au/regionalbustickets** වෙත පිවිසෙන්න

## ඔබේ myki ලියාපදිංචි කරන්න

ඔබේ myki ලියාපදිංචි කිරීම මගින්, ඔබට පහත දැක්වෙන දේ කිරීමට හැකි වේ:

– ඔබගේ ශේෂය හා සංචාරක ඉතිහාසය පරීක්ෂා කිරීම
– PTV යෙදුම මතට අවශ්‍ය මුදල් ප්‍රමාණය දැමීම
– ඔබේ කාඩ්පත නැති වුවහොත් හෝ සොරකම් කළහොත් ඔබේ ශේෂය ආරක්ෂා කිරීම
– අවශ්‍ය මුදල් ප්‍රමාණය දැමීම ස්වයංක්‍රීයව සකස් කිරීම
– mykis 10 ක් දක්වා කළමනාකරණය කිරීම

මෙම කේතුව **ptv.vic.gov.au/register** ඔස්සේ හෝ PTV යෙදුම භාවිතයෙන් පරිලෝකනය කිරීම මගින් ඔබට ඔබේ myki ලියාපදිංචි කිරීමට හැකිය.

## Mobile myki

Mobile myki යනු Google Wallet යෙදුම මත ඔබගේ Android දුරකථනයේ තැන්පත් කරන ඩිජිටල් myki එකකි. ඔබට ක්‍රියාශීලීව අවශ්‍ය මුදල් ප්‍රමාණය දැමීම, ඔබේ දුරකථනය මගින් ස්පර්ශය ක්‍රියාත්මක කිරීම හා අක්‍රිය කිරීම සහ තථ්‍ය කාලය තුළ ඔබේ ශේෂය දැන ගැනීම සිදු කළ හැකිය.

ආරම්භ කිරීම සඳහා:

– Google Wallet™ බාගත කරන්න
– ඔබගේ ගෙවීම් කාඩ්පත සැකසීමට Google Wallet™ තුළ ඇති උපදෙස් අනුගමනය කරන්න
– නිල් පැහැති “Add to Wallet” බොත්තමට තට්ටු කර Transport pass තෝරා ගන්න. myki තෝරා ගන්න
– myki Money හෝ myki Pass තෝරා ගන්න
– ඔබේ ගාස්තු නිෂ්පාදනය තෝරා ගන්න: සම්පූර්ණ ගාස්තු, ළමා, ජ්‍යෙෂ්ඨ හෝ සාමාන්‍ය සහන
– ගනුදෙනුව අවසන් කරන්න, ඔබ ගමන් කිරීමට සූදානම්!

Mobile myki පිළිබඳ වැඩිදුර විස්තර සඳහා **ptv.vic.gov.au/mobilemyki** වෙත පිවිසෙන්න

# Free Tram Zone

නගරයේ Free Tram Zone හට නගර මධ්‍යය ඇතුළත් වන අතර එය කුවීන් වික්ටෝරියා වෙළඳපොලේ සිට ඩොක්ලන්ඩ්ස්, ස්ප්‍රින් වීදිය, ෆ්ලින්ඩර්ස් වීදියේ දුම්රිය ස්ථානය හා ෆෙඩරේෂන් චතුරශ්‍රය දක්වා විහිදේ.

**ඔබ නගරයේ Free Tram Zone තුළ පමණක් ගමන් කරන්නේ නම් කාඩ්පත ස්පර්ශ නොකරන්න. ඔබට myki කාඩ්පතක් අවශ්‍ය නොවේ.**

ඔබ Free Tram Zone ඔබ්බට ගමන් කරන්නේ නම් කාඩ්පත ස්පර්ශ කිරීමට මතක තබා ගන්න.




කලාප මායිම් හඳුනා ගැනීම සඳහා ට්‍රෑම් රථ නැවතුම් ස්ථානවල ඇති මෙම සලකුණු සොයා බලන්න.

FREE TRAM ZONE

# City Circle Tram (නගර කවය ඔස්සේ ධාවනය වන ට්‍රෑම් රථය)

City Circle Tram මුළුමනින්ම Free Tram Zone තුළ ධාවනය වන බැවින් එහි ගමන් කිරීම සඳහා ගාස්තුවක් අය නොකෙරේ.

නගර කවය ඔස්සේ ධාවනය වන ඓතිහාසික W Class ට්‍රෑම් රථවල ගමන් කර මෙල්බර්න් පිළිබඳ කථා වලට සවන් දෙන්න.

- දිනපතා උදේ 9.30 සහ සවස 5 දක්වා.
- ට්‍රෑම් රථ සෑම මිනිත්තු 12 කට වරක් දක්ෂිණාවර්තව පිටත් වේ.
- මහ සිකුරාදා සහ නත්තල් දින සේවාවන් නොමැත.



වැඩිදුර විස්තර සඳහා visit **ptv.vic.gov.au** වෙත පිවිසෙන්න, නැතහොත් **1800 800 007** අමතන්න.

ඔබ බිහිරි නම්, හෝ ඔබට ශ්‍රවණාබාධ හෝ කථන ආබාධ තිබේ නම්, National Relay Service හරහා අප හා සම්බන්ධ වන්න - වැඩිදුර විස්තර සඳහා, **relayservice.gov.au** වෙත පිවිසෙන්න.

2024 ජනවාරි 1 වැනි දින සිට

තොරතුරු වෙනත් භාෂාවලින් ලබා ගැනීම සඳහා:

| | | | |
|---|---|---|---|
| 普通話 | 9321 5454 | 廣東話 | 9321 5441 |
| **Italiano** | 9321 5444 | ਪੰਜਾਬੀ | 9321 5445 |
| **Ελληνικά** | 9321 5443 | हिन्दी | 9321 5442 |
| **Việt-ngữ** | 9321 5449 | සිංහල | 9321 5446 |
| عربي | 9321 5440 | **Español** | 9321 5447 |

ඔබේ භාෂාව ලැයිස්තුගත කර නොමැති නම් **ptv.vic.gov.au/languages** වෙත පිවිසෙන්න, **9321 5450** අමතන්න.

DTP0477-E/23

VICTORIA State Government | Department of Transport and Planning

1 ස්ප්‍රින් වීදිය, බෙල්බර්න් හි පිහිටි ප්‍රවාහන සහ ක්‍රමසැලසුම් දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලදී